

## සාම කුමරු ඉපදුණා

අඳුර දිනන සීත රැයක
දිළෙන තරුව පෑයුවා

තරු මං දත් රජවරු සැම
තුටු පඬුරුද ගෙන සැරසුණා
මහ බලවත් රජෙකු ලොවට
බිහිවී ඇතැයි කියවුණා

දු ' කතර ගෙවා නිරිඳු තිදෙන
රජු දකින්න පෙළඹෙනා
රන් ආලේපිත රජ මැඳුරක්
යස ඉසුරින් පිරුණු තැනක්
සිත් මවමින් ගමනෙ 'නා

දිලෙන තරුව නැවතෙනා
දිළිඳු පැලක් පෙනෙන්නා
බලවත් රජු මේ කොහේද ?
රජුන් තිදෙන සොයන්නා

සුර දූතයෝ දොරකොඩ සිට
රජුන් තිදෙන පිළිගන්නේ
සොයමින් සිටි බලවත් රජු
ගව ලෙනකනේ සැතපෙන්නේ

සුවඳ ලාටු, සුව පැනින්
පුංචි බිළිඳු නැහැවෙන්නේ
නිරිදො තිදෙන සිරස නවා
ගරු බුහුමන් දක්වන්නේ

සුර දූතයෝ මිහිරි හඬින්
ප්‍රීති ගීත ගයන්නේ
සාම කුමරු උපන් සතුට
මුලු ලොවටම කියන්නේ

### ප්‍රසාදිනී වෙත්තසිංහ
මිල්පාක්

## බහු සංස්කෘතියක අසිරිය

අහස පුරා සලරෑ ඉදිකරමින්
සියොතුන් ඉගිලෙන්නේ
විල්තෙර අභියස පෙළහර පාමින්
මොනරුන් රඟ දෙන්නේ
දිය පිරි විල් ඇති තුරුලිය අඩු නැති
උයනක් බැබලෙන්නේ

තුරු අතු අග පිපි මල් දුටු බමර පැටික්කෙක්
මේ ලෙස විමසන්නේ

"සියොතුන් තටු වල මොනරුන් පිල් අග විවිධ වර්ණ
ඇත්තේ
පිපිල තිබෙන මල් එකාකාරය ඇයි ඒ ලෙස
නැත්තේ"

"අකලට පිපි මල් ඔහොම තමයි
උඩුයි පැහැයෙන්, අඩුයි සුවඳෙනුත්
නුඹ ඉපදුන පසු එන පලමු වසන්තය
එළඹෙයි ලඟදිම නියම මල් පිපෙන
ඉවසන් පැටියෝ එතකන් ටිකකට"
උන් මව පහදන්නේ

බමර පැටික්කන් මන්මත් කරවන
ලොකු වෙනසක වුනි
එලඹි වස්නතයෙ

තුරු සහ වැල් සැම
ඍතු කහ නිල් සුදු
සළු පොරවාගත්
නිරූපිකාවන් පිරිසක් විලසය
විලාසිතා දැක්මට පෙළගැසුන

### ඩබ්ලිව් ජේ ඇපා

## අවසන් කනුව

ජීවිතයේ සහනය සොයා ගිය ඇයව
උාදරයෙන් පිලිගත් දුෂ්ට සමාජයෙන්
අත්වූ ඉරනමද සෙනෙහසින් පිලිගත්තද
සොහදහමින් එලඹෙන අභියෝගයට
තනිවම මුහුණ දියයුතු ඇය
අසරණ වූ විටත්
දුෂ්ට වූ සමාජය උත්සහ කරනුයේ
අවසන් හුස්ම හෙලන තුරුත්
ඔවුන් බලාපොරොත්තු
තවදුරටත් ඉෂට කර ගැනීමටය.

මේ හැම දෙයක්ම සිදුවන
ආකාරයෙන්ම මනසින් දැකීමට
ඇයට හැකියාව තිබුනත් ක්‍රියාවෙන්
ඇයට මෙම දුෂ්ට සමාජයෙන්
වෙන්වීමට නොහැකි වූයේ ඇය කුඩාකල
සිටම සමාජයටම ඇලුම් කල බව
ඇයම සාක්ෂි දරන හෙයිනිග

මෙම දුෂ්ට සමාජය මුලිනුපුටා
දැමීමට ලොව ඇති එතම ශක්තියටත්
ඇය දුෂ්ට වූයේ
බලාපොරොත්තෙු වූ තාවකාලික සහනයට
මිස සෙනෙහසින් නොවන බව
දැනෙන විට ඇය කඳුලෙන් පිරි දෙනෙතින්
යුතුව ජීවිතයේ
අවසන් කනුවට හේත්තු වී සිටියෙමි.

### රන්මලී කොතලාවල
දලුපොත

## ප්‍රහර්ෂ

රන්තරු නිමි නැති
දියේ දිලී
පුන් සඳ නිලබර
රශ්මි දිදී
පත් තරු පවනට
හාදු දිදී
පුත් ආ සුර මල
කුසුම් පිපී

### මධූ වර්නකුලසූරිය

## පිං මදිය මට ඔහු ලබන්නට

සොදුරු සෙනෙහසේ අන්තිමය
නොදැන ප්‍රේමයේ වෙනත් පැතිකඩ
ඒක් වුනිය අප අන් අයව තුට කොට
නොදැන ආලයේ නියම ඇරුත්බව

ඔහුට මදිවිය කලක් ගියපසු
මගේ ප්‍රේමයේ සදාකාලික බව
බැදුනි අන් අය කෙරෙහි ලොල් බව
අසරන වුනිය මා දෙදරුවන් සමඟ

පතිදමට ජීවිතය පුදනට
දිවිරුවෙන් මා අත්සනක් කොට
හැරිය ලංවන්න දෙවැන්නෙකුට මා වෙත
බැගෑවෙන් ඔහුගෙන් ඉල්ලුවත් මගේ පෙම

මුහුකුරා ගොස් ඔහුද පෙම් බැද
විවාහ වුවද ඔහු සුභ පැතුම් මැද
ඇයට මදිවිය ඔහුගෙ සෙනෙහස
මං මුලා වූ ලෙස අතරමං විය

මගේ දුක ඔහු හඳුන ගත්තද ?
මගේ හොඳ බව ඔහුට දැනුනිද ?
අපව අප මුන ගැසුනු මුල් දින
ප්‍රේමයෙන් අප දෙදෙන නොබැදුනිද ?

ඔහුට නොහිමි වූ ඇගේ සෙනෙහස
කෙලෙස ලබම්ද ? බැමි බැදී ඇත
ඔහුවන් සොදුරු මිනිසෙකු ලබන්නට
නො හැක මා හට පිං මදිකමක් මිස

බැලිය බලනට කෙලින් ඔය නෙත
පැගෑපත් වූ ඉල්ලීමක් එහි ඇත
බැරි වුනත් මේ ආත්මයේ ලබන්නට

### එල් ආර් පෙරේරා

## ගුරු ඔබට

සිරගෙයක් වැසෙයි සිතමින්
පාසලක් අරියි මැතිඳුන්
වට කරන මහා පවුරෙන්
සිරවෙලා සිටියි සිසුවන්

ඇමති ලග වැටී දෙදණින්
යැදී බත් පත ඇදුරන්
මතුරැකෙන ශිල්පයම සොයමින්
සිසුන් යැයි ගියමගම ගුරුවන්

ඇවිද පසුපස ගුරුන්
අභිසෙක් ලබයි නිවටුන්
පැලඳු එම කටු ඔටුනින්
පෙලයි සහෝදරදරියන්

අසන පැනයට කෝපයෙන්
නගා වේවැල මහ හඬින්
දෙන ආදර්ශ ගෙන බැතින්
පාලකයකු වන්න උගනින්

### රංජිත් වීරසිංහ



## නැවතත් සිහිකරමු නත්තල්

ඉසිකෝ මානෙන් ගිනි ගෙන දැවෙනා
හදවත සිත අප ගිනි උදුනක් නම්
මිනිසා දිනවන වඩන නත්තලේ
ප්‍රේමය සිසිලස කොතැනද ඇත්තේ

උපන් සමිදු මහ ජේසු කුමරුගේ
පහසින් මළු ලොව ආසිරිමත්වී
එවන් වහල් ගති දුරින් දුරුවෙලා
සැමටම සුභ නත්තල අත්වේවා

රැන්දු සුදු පත් දසැගිලි අතරේ
සුරා මත් රැගුම් බොළඳ හඬ නැතේ
උත්සවයක්දෝ නත්තලත් එසේ
දොර ඇරිලා ඇත අප විනාශයේ

පරදෙස් ගැති කම අප වත්කම නම්
ණයටම ගැති කම අප දිවි මග නම්
හීන දීන ගති දැය ගිළ ගන්නේ
එවන් තැනක නැත සතුට නත්තලේ

### බෙනඩික්
HAMPTON PARK

## විල්ලුද පුටුව

ලංකාව සිහිවෙන්න
වඩම්මපු කවිච්චිය
ගම්භීර වැඩි නිසා
ඉඳගන්න කෙනෙක් නැත

### ලක්ෂ්මී ගුණරත්න

## බලාපොරොත්තුවක්



සිඟිති මුවේ කැකුළු සිනා
දැක ගැන්මට දිනපතා ම
මා දැඩි වෙහෙසක් ගත් බව
ඇය තවමත් නැහැ දන්නේ
අතීතයට එකතුවෙද්දී

ලපටි හදවතේ කොනකින්
මටත් ඉඩක් දෙයිද කියා
එක් පියකරු සැන්දෑවක
ඇගේ දෙනෙත් තුලට එබී
විපරම් කරමින් බැලුවෙමි.

හද විමනේ ඇඳී තිබුන
බිතු සිතුවම් මැද මගෙ රුව
නොකිලිටි ලෙස වැජඹෙනු මම
ඇගේ දෙනෙත් කවුළු තුලින්
පැහැදිලි විලසට දුටියෙමි.

මගේ පුංචි පැතුම් මල්ලෙ
තිබෙන මිහිරි හැඟුම් පොදිය
එකක් නෑර, සොඳුරු ලෙසට
සැබෑවේවී මින් මතුවට

### මාලා කරුණාතිලක